දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජූනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

ආවිසා 2.1 - සූක්ෂම ආර්ථික න්‍යාය
# ECG 2.1 - Micro Economic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. (අ) උපේක්ෂා වක්‍රය යන්න අර්ථ දක්වන්න.

(ලකුණු 02 යි)

(ආ) "උපේක්ෂා වක්‍ර එකිනෙකට ඡේදනය නොවීම උපේක්ෂා වක්‍ර සිතියමක මූලික ලක්ෂණයකි." උපේක්ෂා වක්‍ර සිතියමක් භාවිතා කරමින් මෙම ප්‍රකාශයේ නිරවද්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

(ඇ) පහත සඳහන් අවස්ථාවන්ට අදාළ පාරිභෝගික උපේක්ෂා වක්‍ර සිතියම් නිර්මාණය කොට ඒ එක් එක් උපේක්ෂා වක්‍ර සිතියම් හි ආන්තික ආදේශන අනුපාතය කුමන ස්වරූපයක් පිළිඹිබු කරන්නේදැයි පැහැදිලි කරන්න.

i. X හා Y පූර්ණ ආදේශන භාණ්ඩ වේ.
ii. X හා Y පූර්ණ අනුපූරක භාණ්ඩ වේ.

(ලකුණු 06 යි)

(ඈ) පහත සඳහන් අවස්ථාවන් නිරූපනය කරන ආදායම් පරිභෝජන වක්‍රය හෝ මිල පරිභෝජන වක්‍රය නිර්මාණය කරන්න.

i. X බාල භාණ්ඩයක් හා Y සාමාන්‍ය භාණ්ඩයක්
ii. X අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක්

(ලකුණු 08 යි)

02. (අ) "එක්තරා පාරිභෝගිකයකුට X බාල භාණ්ඩයකි" ඒ අනුව X භාණ්ඩයේ මිල අඩු වීමක දී ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය හැසිරෙන ආකාරය ආදායමේ වන්දි විචලනය ක්‍රමය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) පුද්ගලයින් දෙදෙනකු පමණක් සිටින සහ භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරන ආර්ථිකයක් උදාහරණයට ගනිමින්; "ස්වයංපෝෂිත ආර්ථිකයකට වඩා හුවමාරු ආර්ථිකයක සමාජ සුභ සාධන මට්ටම ඉහළ අගයක් ගනී" යන ප්‍රකාශය උපේක්ෂා වක්‍ර උපයෝගී කොට ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

03. (අ) "නිෂ්පාදන ශ්‍රිතය" යන්න හඳුන්වා දී දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයක් කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයකින් වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(ආ) ඒ ඒ අවස්ථාව සඳහා සුදුසු සම නිෂ්පාදන වක්‍ර සිතියම් භාවිතා කරමින් පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

i. අඩුවන පරිමාණානුකූල ඵල
ii. ප්‍රශස්ත සාධක සංයෝගය
iii. ප්‍රසාරණ මාර්ගය

(ලකුණු 15 යි)

04. ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් ශ්‍රිතය $P = 24 - 3Q$ වන අතර සාමාන්‍ය පිරිවැය ශ්‍රිතය $AC = Q + 8$ වේ.

(අ) මෙම ආයතනයේ අරමුණ ලාභ උපරිම කිරීම නම් එම අවස්ථාවේ දී.

i. මිල හා ප්‍රමාණය ගණනය කරන්න.
ii. ලාභය ගණනය කරන්න.
iii. පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න.

(ලකුණු 10 යි)

(ආ) මෙම ආයතනය සිය අරමුණ ලාභ උපරිම කිරීම නොව විකුණුම් අයභාරය ලෙස තීරණය කළේ නම් එම අවස්ථාවේ දී,

i. මිල හා ප්‍රමාණය ගණනය කරන්න.
ii. ලාභය ගණනය කරන්න.
iii. පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න.
iv. ආන්තික අයභාර ශූන්‍ය වන බව හා ඉල්ලුම් නම්‍යතාව -1 වන බව සාධනය කරන්න.

(ලකුණු 10 යි)

05. (අ) "දෙවන මාත්‍ර මිල විශේෂණය හා සසඳන කළ පළමු මාත්‍ර මිල විශේෂණය පාරිභෝගිකයාට වඩාත් අහිතකරය" මිල විශේෂණය යන්න විස්තර කර ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(ආ) "පූර්ණ තරඟකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය එක හා සමාන නොවේ" එම ආයතනයන් හි ඉල්ලුම් වක්‍රයන් හි ස්වරූපය හා ඊට අදාළ වන හේතු ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 06 යි)

(ඇ) "ඒකාධිකාරී තරඟ ආයතනයක දිගුකාලීන සමතුලිත අවස්ථාවේ දී වුවත් සම්පත් භාවිතය අකාර්යක්ෂම වේ" ඒකාධිකාරී තරඟ ආයතනයක දිගුකාලීන සමතුලිත අවස්ථාව නිරූපනය කරන රූප සටහනක් යොදා ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

06. (අ) කතිපයාධිකාරී වෙළෙඳ පොළ ව්‍යුහයක මූලික ලක්ෂණ ඉදිරිපත් කරන්න.

(ලකුණු 03 යි)

(ආ) කතිපයාධිකාරය පිළිබඳ කුනොට් ගේ විග්‍රහයේ හා එජ්වර්ත් ගේ විග්‍රහයේ ඇති සමානතා සහ අසමානතා සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

(ඇ) "එකතුව ශූන්‍ය ක්‍රීඩාව" යන්න විස්තර කර පහත සඳහන් ගෙවුම් න්‍යාය ඇසුරින් අවසන් සමතුලිත අවස්ථාවේ දී වෙළෙඳ පොළ අල්ලා ගැනීමට A සහ B අනුගමනය කරන ක්‍රමෝපායන් තීරණය කරන්න.

A ගේ ගෙවුම් න්‍යාසය

| B ගේ උපක්‍රම / A ගේ උපක්‍රම | $B_1$ | $B_2$ | $B_3$ |
|---|---|---|---|
| $A_1$ | 20 | 35 | 30 |
| $A_2$ | 30 | 25 | 40 |
| $A_3$ | 50 | 40 | 70 |

(ලකුණු 07 යි)

07. (අ) i. සාධක වෙළෙඳ පොළ තුළ ඒකාධිකාරී සූරා කෑම හා ක්‍රයේකාධිකාරී සූරාකෑම ඇතිවන අවස්ථාවන් රූප සටහන් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 08 යි)

ii. වෘත්තීය සමිති, ඒකාධිකාරී සූරාකෑම හා ක්‍රයේකාධිකාරී සූරා කෑම ඉවත් කර ගැනීමට වැටුප් වැඩිකර ගැනීමේ වෘත්තීය ක්‍රියා මාර්ගවලට එළඹීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

(ආ) "ආර්ථික බදු කුලිය" විස්තර කර පහත සඳහන් අවස්ථාවන් නිරූපණය කරන රූප සටහන් ඉදිරිපත් කරන්න.

i. ආර්ථික බදු කුලිය ශූන්‍ය වන අවස්ථාව

ii. සම්පූර්ණ ඉපයීම ආර්ථික බදු කුලිය වන අවස්ථාව

(ලකුණු 06 යි)

08. පහත සඳහන් සංකල්ප අතුරින් <u>දෙකක්</u> විස්තර කරන්න.

(අ) පිරිවැය වෙනස ක්‍රමය

(ආ) වැටි රේඛා

(ඇ) නැමුණු ඉල්ලුම් වක්‍ර විග්‍රහය

(ඈ) ආන්තර බදු කුලිය

(එක් කොටසකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 20 යි)